පදවිය ප්‍රාදේශීය සභාව
අනුරාධපුර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 19 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණකාධිපති වාර්තාව 2020 ජුනි 08 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය නොකළ මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පදවිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

(අ) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 03 ක් ඉක්මවූ කාලයක සිට පැවතඑන රු.652,134 ක්වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 03 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් තොරතුරු විමසා ලිපියක් යවා ඇත. |

(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.336,661,047 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාලව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | පිළිගනිමි. |

02. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.825,563 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.1,208,442 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 260,000 | 151,000 | 151,000 | - | 1,050,000 | 1,091,230 | 1,091,230 | - |
| (ii) | කුලී | 4,568,000 | 2,758,250 | 2,747,450 | 10,800 | 3,461,800 | 3,042,219 | 3,042,219 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,660,000 | 1,269,790 | 1,269,790 | - | 181,000 | 246,629 | 246,629 | - |
| (iv) | වෙනත් ආදායම් | 1,317,500 | 3,498,746 | 2,402,599 | 1,096,147 | 1,108,500 | 1,319,227 | 988,782 | 976,572 |
| | | 7,805,500 | 7,677,786 | 6,570,839 | 1,106,947 | 5,801,300 | 5,699,305 | 5,368,860 | 976,572 |

2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන ගැසට් නිවේදන පළකර වරිපනම් බදු අයකරගෙන නොතිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්ති ප්‍රකාර වරිපනම් බදු පනවා අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන සිතියම්ගත කර ඇත. ඉදිරියේදී ගැසට් නිවේදන පලකර වරිපනම් අයකර ගැනීමට කටයුතු කරමි. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

(අ) උසාවි දඩ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.695,147 ක් විය. | උසාවි දඩ ආදායම හඳුනා ගෙන කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | උසාවි දඩ ආදායම රැස්කර ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් සිටියි. |

(ආ) මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු මුද්දර ගාස්තු රු. 401,000 ක් විය. | හිග මුද්දර ගාස්තු ආදායම කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයට උපකල්පිත වටිනාකමක් ගෙන ඇති අතර සත්‍ය වටිනාකම සොයා අයකර ගැනීමට කටයුතු කරමි. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ,ජනතාවගේ සුබ විහරණය ,පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව වූ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා පොදුවේ පැනවූ අතුරු ව්‍යවස්ථා වැළඳගෙන ඇත. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | සභාව විසින් ඉටු කළයුතුව ඇති කාර්යය හා කාර්තව්‍යයන්ට අදාලව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | ඉදිරියේ දී කටයුතු කරමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව විසින් ගෙන තිබුණු ක්‍රියාමාර්ග විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාල චක්‍රලේඛනයන් අධ්‍යයනය කර ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය. |

3.2 මතභේදයට තුඩුදුන් ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට රු.109,033,257 ක් වූ සභාවට අයත්ව තිබුණු ස්ථාවර වත්කම්වල වටිනාකම සභාව විසින් පත්කර තිබුණු කමිටුවක තක්සේරුවක් පදනම්ව රු.393,877,929 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම නිසා ස්ථාවර වත්කම්වල වටිනාකම 361% කින් වැඩිවී තිබුණි. | දේපළ තක්සේරු කිරීම විශේෂඥ දැනුමක් ඇති නිලධාරීන් මගින් සිදුකරවාගත යුතුවේ. | ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන හා ලේඛනවලට නොගෙන තිබූ සහ වර්තමාන වෙළඳපොල වටිනාකම මත අගය තක්සේරු කර ඇති බැවින් වටිනාකම මෙම ප්‍රමාණයෙන් වැඩි වී ඇත. |

3.3 වත්කම් කළමනාකරණය

3.3.1 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 02 සිට වසර 05 දක්වා කාලපරිච්ඡේදයක සිට රු.1,620,000 ක් වටිනා වත්කම් නිශ්කාර්යව පැවතුණි. | භාවිතා කළ හැකි වත්කම් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හා අනෙකුත් වත්කම් අපහරණය කිරීමට කටයුතු කළයුතු වේ. | අංක LE -7506 දරන කැබ්රථය අළුත්වැඩියා කිරීමටත් RD -9451 ට්‍රැක්ටරය භාවිතා කිරීමට හෝ නැවත භාරදීමටත් අනෙක් නිශ්ක්‍රීය වත්කම් බදුදීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කරමි. |

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

---------------------------------------

අභ්‍යන්තර විගණනය

-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව සෘජුවම වගකියනු ලබන අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර ඇති අතර කාර්ය මණ්ඩල පුරප්පාඩු හේතුවෙන් විගණන කටයුතු සිදුකිරීම ප්‍රමාද වී ඇත. |